www.xtrapapers.com
www.PapaCambridge.com

UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2: Translation and Reading Comprehension

May/June 2004

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen on both sides of the paper.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.
At the end of the examination, fasten all your work securely together.



UNIVERSITY of CAMBRIDGE

www.xtrapapers.com
www.PapaCambridge.com



## Section A – Translation

**1** Translate into **English**.

ඇසළ මාසයේ දී පෙරහැර සඳහා සූදානම් වනු පෙනේ. මේ පෙරහැර අතර තුනක් ප්‍රධානය. ඉන් එකක් නම් මහනුවර දළදා මාලිගාවේ පෙරහැරයි. මෙය මුල දී බෞද්ධ පෙරහැරක් නොවිය. එය ආරම්භයේ දී දෙවිවරුන් වෙනුවෙන් පැවැත් වූ පූජෝත්සවයක් විය. එම දෙවිවරුන් අතර අලුත්නුවර දෙවියන්ට ප්‍රධානත්වයක් ලැබුණි. එහෙත් කීර්ත් ශ්‍රී රාජසිංහ රජතුමාගේ කාලයේ දී මේ සියල්ල වෙනස් විය. බුදුන් වෙනුවට දළදාව ගෙන යාමට පටන් ගැනීමත් සමග මෙය බෞද්ධ පෙරහැරක් බවට පත්විය.

[10 Marks]

**2** Translate into **Sinhala**.

The Veddas are one of the most ancient people living on earth. We do not know how long ago they crossed the sea to Sri Lanka. Until about 4000 years ago, they lived in all parts of the island. Now, they live mainly in south-eastern Sri Lanka. The borders of their domain are formed by the Uva and Magam Pattu districts in the south, the hilly country in the west and south-west and the Mahaweli Ganga in the north.

The Veddas rarely leave the lovely jungle, where they hunt animals and gather food from the forest. If they leave their domain, they do so to exchange meat for tools and other goods.

The Veddas are proud of their heritage and call themselves Vanniyaletto, which means “Those of the Forest”.

[20 Marks]

www.xtrapapers.com

www.PapaCambridge.com



## Section B – Comprehension

Read the following passage carefully and answer in **Sinhala** the questions that follow.

### ජෙෆ්රි බාවා

ශ්‍රී ලංකාවේ ගෘහ නිර්මාණ ශිල්පීන් අතර ඉතාමත්ම වැදගත් කෙනෙකු වූ ජෙෆ්රි බාවා ලෝක ප්‍රකට වූවෙකි. 1919 දී ලංකාවේ උපන් ඔහු 1938 දී නීතිය හැදෑරීම සඳහා එංගලන්තයට ගියේය. 1946 දී ආපසු ලංකාවට ගිය ඔහු පළමුව නීතිඥ සමාගමක වැඩ කළේය. එහෙත් ඒ දිගු කලකට නොවේ. ඉක්මණින්ම ඒ රැකියාව අත්හළ ඔහු වසර දෙකක් ලොව වටා සංචාරය කළේය. මේ සංචාරයෙන් පසු ගෘහ නිර්මාණ ශිල්පය හැදෑරීම සඳහා බාවා යළිත් එංගලන්තයට ගියේය. අන්තිමේ දී වයස 38 දී ඔහු එම විෂයයෙන් සුදුසුකම් සම්පූර්ණ කර ගත්තේය.

හේ ගෘහ නිර්මාණ ශිල්පියකු වශයෙන් කොළඹ සිට වැඩ කරන්නට පටන් ගත්තේය. ඔහු හැම ආකාරයකම ගොඩනැගිලි සැලසුම් කළේය. ඔහුගේ මුල් කාලීන ගෘහ නිර්මාණ අතර නූතන මෙන්ම බටහිර ස්වරූපයේ ඒවා ද විය. පසුව ඔහු ලංකාවේ සාම්ප්‍රදායික ගෘහ නිර්මාණ හා ගොඩ නැගිලි ද්‍රව්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන්නට විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ ගෘහ නිර්මාණ, නූතන හා සාම්ප්‍රදායික ගෘහ නිර්මාණ ශිල්පයේ සම්මිශ්‍රණයක් වශයෙන් දියුණු විය.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික භූමි දර්ශනවලින් ඔහු විශාල වශයෙන් ආභාසය ලැබීය. සර්ම කලාපීය වෘක්ෂලතාවන්ට බාවා කොතරම් ඇලුම් කළේ ද යත් ඒවා ඔහුගේ ගෘහ නිර්මාණයන්හි අංග බවට පත් කිරීමට ඔහුට අවශ්‍ය විය. ඔහුගේ ගොඩ නැගිලි තුළ ජීවත් වන්නවුන්ට අවට ප්‍රදේශයේ භූමි දර්ශනය හොඳින් පෙනිය යුතු බව විශ්වාස කළ ඔහු තමා නිර්මාණය කළ නිවාසවල ජනෙල් හා විවෘත ස්ථාන රාශියක් යොදා ගැනීම මගින් මේ අරමුණ ඉටුකර ගත්තේය.

1961 දී කොළඹ තැන වූ නිවසක් ඔහුගේ මුල්ම නිර්මාණවලින් එකකි. හරිත උයනක් (මැද මිදුලක්) එහි මැද ඇති අතර කාමර වැඩි ගණනක ජනේල යොදා ඇත්තේ ඇතුළු පැත්තටය. මේ නිසා, විශ්වාස කරන්නට බැරි තරම් කලබලකාරී, ශබ්දවලින් පිරුණු නගරය මැද ‘මේ නිවස නිසළ කෙම් බිමකි’ යන හැඟීමක් ඇති වේ. සර්මකලාපීය නගරයක් මැද ජීවත්වීම හා වැඩ කිරීම සඳහා අලුත් ක්‍රමයක් මේ ගෘහ නිර්මාණ ක්‍රමය පෙන්නා දුන්නේය.

1970 දී ඔහු බෙන්තොට හෝටලය ගොඩ නැගුවේය. නූතන සංචාරකයා බලාපොරොත්තු වන සියලුම පහසුකම්වලින් එය සමන්විත වේ. ඉන්පසු සාදවන ලද ගොඩනැගිලි අතිවිශාල සංඛ්‍යාවක පූර්වාදර්ශය බවට මේ හෝටලය පත්විය. 1979 දී නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල සැලසුම්

කිරීමට පවරනු ලැබීම බාවාගේ වැඩී වෙමින් පැවති සාර්ථකත්වය ඉහළින්ම පිළිගනු ලැබීමකි.

බාවාගේ ගෘහනිර්මාණ හා ඒ පිළිබඳ ඔහුගේ අදහස් වලින් සාමාන්‍ය ජනතාවට සෘජු බලපෑමක් නැතැයි සිතන අය සිටිය ද, ඔහුගේ ගෘහ නිර්මාණ ශ්‍රී ලාංකිකයින්ට මැකී යමින් පවතින දේශීය සම්ප්‍රදායයන් අගය කිරීමට උගන්වා ඇතැයි යන අදහස හා එකග වන බොහෝ අය ද සිටිති. නිදහස් ශ්‍රී ලංකාවේ අලුතින් දියුණුවන ගෘහ නිර්මාණ ශිල්පය හා තරුණ ගෘහ නිර්මාණ ශිල්පීන් පරම්පරා ගණනක් කෙරෙහි බාවා ප්‍රබල ලෙස බල පා ඇත.

www.xtrapapers.com
www.PapaCambridge.com



Answer the following question in **Sinhala** using your own words as far as possible:

1 ජොෆ්රි බාවා ප්‍රසිද්ධ කුමකට ද?
2 ඔහු පළමුව එංගලන්තයට ගියේ කුමක් සඳහා ද?
3 ඔහුගේ පළමු රැකියාව වූයේ කුමක් ද? [1]
4 ඔහු තම පළමු රැකියාවට කැමති වී ද?
ඔබේ පිළිතුරට හේතු දක්වන්න. [2]
5 ඔහු ගෘහ නිර්මාණ ශිල්පියකු වශයෙන් පුහුණු වූයේ කොහේදී ද? [1]
6 බාවා සුදුසුකම් සම්පූර්ණ කරගත් වයසෙහි විශෙෂත්වය කුමක් ද? [2]
7 බාවා විශෙෂඥතාවක් දැක්වූයේ කුමන අන්දමේ ගොඩනැගිලිවලට ද? [1]
8 ඔහුගේ මුල්කාලීන ගොඩනැගිලිවල පෙනුම කෙසේ වී ද? [1]
9 ඔහුගේ නිර්මාණ වෙනසකට භාජනය වූයේ කුමන බලපෑම යටතේ ද? [2]
10 බාවා විශෙෂ ඇල්මක් දැක් වූයේ ලංකාවේ කුමන අංශයට ද? [1]
11 බාවාගේ ගෘහ නිර්මාණයන්හි ජනේල සහ විවෘත කොටස් විශාල
සංඛ්‍යාවක් යොදාගෙන තිබීමට හේතු 2 ක් පෙන්වන්න. [2]
12 "කලබලකාරී, ශබ්දවලින් පිරි නගරයක් තුළ නිසළ කෙම්බිමක්" යන ධි
ප්‍රකාශනයෙන් ඔබට අදහස් වන්නේ කුමක් ද? [3]
13 බෙන්තොට හෝටලය ගොඩ නැගීමෙන් පසුව බාවා විශාල
සාර්ථකත්වයක් ලැබූ බව අප මේ ලෙඛණයෙන් දැන ගන්නේ කෙසේ ද? [2]
14 මේ ලෙඛණයේ සඳහන් වන, 'බාවාගේ ගෘහනිර්මාණ හා ඒ පිළිබඳ
ඔහුගේ අදහස් සාමාන්‍ය ජනයාගේ ජීවිත කෙරෙහි සෘජු බලපෑමක්
නොකළේය' යන අදහස ගැන ඔබ සිතන්නේ කුමක් ද? [3]
15 ශ්‍රී ලාංකික සාමාන්‍ය ජනයාට බාවාගේ ගෘහ
නිර්මාණයන්ගෙන් යහපතක් වී ඇත්තේ කුමන ආකාරවලින් ද? [2]

[25 Marks]

*Copyright Acknowledgements:*

Every reasonable effort has been made to trace all copyright holders. The publishers would be pleased to hear from anyone whose rights we have unwittingly infringed.

University of Cambridge International Examinations is part of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.